# ශ්‍රී ලංකාවේ විසම්මුතිය මර්දනය

2014 සැප්තැම්බර්



ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයෙකු වූ ආචාර්ය රාජිණී තිරාණගම සැමරුම සහ සාමකාමී පා ගමන යාපනයේ බලධාරීන් විසින් තහනම් කරන ලදී. විශ්ව විද්‍යාල ආචාර්යවරියක වූ රාජිණී තිරාණගම 1989 සැප්තැම්බර් 21 වන දින එල්ටීටීඊ සංවිධානවය විසින් වෙඩි තබා ඝාතනය කරන ලදී
[Photo: Internet]


INFORM Human Rights Documentation Centre
www.ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කරන ලද සිදුවීම්

**A.** රජයට විරුද්ධ බව පෙනෙන පුද්ගලයන්ට මරණ තර්ජන, හිරිහැර, බිය ගැනිවීම සහ සීමා

**B.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

**C.** උතුර සහ නැගෙනහිර පළාත් වල පැවැත්වීමට නියමිතව තිබූ ගැණ සැමරුම් සහ යාඥා මෙහෙයට බාධා සහ තර්ජන

**D.** රැසිවීමේ නිදහස් උල්ලංඝණය කිරීම

**E.** ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

**F.** විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

*ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙහි ශ්‍රීලංකාවේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත්ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙළෙසීමට ලක්වන අනෙක් ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේදී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය, මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රීලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය

සැප්තැම්බරය, දෛනිකව විසම්මුතිය මර්දනය කිරීමේ සිදුවීම් වාර්තා වූ තවත් මාසයක් විය. ප්‍රකට මානව හිමිකම් ආරක්ෂකයෙකු සහ ශාස්ත්‍රඥයෙකු වූ ආචාර්ය රාජිනී තිරාණගම වෙනුවෙන් සැළසුම් කර තිබුණු ගුණ සැමරුම් උත්සවය පැවැත්වීමට වෙන් කර තිබූ ස්ථාන අහිමි කිරීමෙන් එයට බාධා එල්ල කර අතර පොලිසිය විසින් විරෝධතා පා ගමන තහනම් කරන ලදී. යාපනය දිස්ත්‍රක්කයේ අවතැන් වූ දෙමළ පුරවැසියන් වෙනුවෙන් සූදානම් කර තිබූ යාඥා මෙහෙය තහනම් කරන ලද අතර ඝාතනය කරන ලද පුද්ගලයන් සිහිකිරීමේ සැමරුම් උත්සව තහනම් කිරීමට සති දෙකක් තුළ දෙවතාවකදී මඩකලපු පොලීසියව විසින් අධිරණයෙන් නියෝග ලබා ගන්නා ලදී.

මානව හිමිකම් නීතීඥවරුන් දෙදෙනෙක් ට කොළඹදී මරණ තර්ජන එල්ල විය. විරුද්ධ පාක්ෂික වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ට පහර දෙන ලදී. ජූනි මාසයේදී මුස්ලිම් විරෝධී කෝලහල පැවැති අළුත්ගම ප්‍රදේශයේ ඇති වූ සිදුවීමක් වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට ආරක්ෂක හමුදාවන්ගෙන් බාධා එල්ල විය . ඌව පළාතේ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා කරමින් සිටි ජනමාධ්‍යවේදීන්ට පහර දෙන ලද අතර එක් ජනමාධ්‍ය වේදියෙකු බරපලත තුවාල ලබා රෝහල් ගත කරන ලදී. උතුරේ දෙමළ ජනමාධ්‍යවේදියෙකු අනූ නමයෙන් මරණයෙන් බේරුණු අතර යාපනයේ දෙමළ ජනමාධ්‍ය ක්‍රියාකාරීන් නිරන්තර ප්‍රශ්න කිරීම්, බිය ගැන්වීම් සහ හිරිහැර වලට ලක් විය. යුධ කාලයේ සිය අත්දැකීම් අලලා කවි පොතක් ලියූ යාපනයේ දෙමළ කතෝලික පූජකවරයෙකු ප්‍රශ්ණ කිරීම් වලට ලක් විය. අදාල පොත තැපෑලෙන් ලැබුණු පාසල් විදුහල්පතිවරුන් කිහිප දෙනෙක්වද ප්‍රශ්ණ කරන ලදී. සිය දේශපාලන මතවාද සහ රජය විවේචන කිරීම හේතුවෙන් ජීවිතයට එල්ල වූ තර්ජන නිසා රටින් පිටුවහල වී ජීවත් වන ලේඛකයෙකු විසින් රචිත ග්‍රන්තයට හිමි වීමට නියමිතව තිබුණු සාහිත්‍ය සම්මානය අන්තවාදී කණ්ඩායම් වල බලපෑම් හේතුවෙන් ඉවත් කර ගන්නා ලදී. විනිශ්ච මණ්ඩලයේ සිටි විනිශ්චකරුවන් පස් දෙනාගෙන් සිව් දෙනෙකු මෙම ග්‍රන්තය සම්මානය සඳහා තේරා ගත් අතර රජයට ගැති අන්තවාදී ලේඛකයෙකු විසින් ඔවුන්ව ද අපකීර්තියට පත් කරන ලදී.

අන්තර්ජාල ජනමාධ්‍යවේදීන් සඳහා මීගමුවේදී පැවැත්වීමට නියමිතව තිබුණු පුහුණු වැඩමුළුව ට බාධා එල්ල කරන ලදී. ත්‍රිකුණාමලයේදී සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් සංවිධානය කරන ලද රැස්වීමක් සඳහා වෙන් තර තිබූ ස්ථානය දෙවරක්ම අහිමි කිරීම මගින් එයට බාධා එල්ල කෙරුණ අතර නිරීක්ෂණයටද ලක් කරන ලදී. ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලයක් විසින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ මානව හිමිකම් ආරක්ෂකයින් දෙදෙනෙකු වෙත ලබා දී තිබුණු ආරාධනාව ආරක්ෂක අමාත්‍යාංශයේ බලපෑම මත අවලංගු කළ බව අදාල විශ්ව විද්‍යාලය මගින් පිළිගන්නා ලදී. පිළිමයක් සම්බන්ධයෙන් කතෝලික ප්‍රජාව විසින් සිදු කරන ලද සාමකාමී විරෝධතාවයට පොලීසිය විසින් ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර එය මැඩපවත්වන ලදී. අතුරුදහන්වීම් පිළිබඳ ප්‍රමුඛ පෙළේ ක්‍රියාකාරිනියක් නිදහස් කරන මෙන් ඉල්ලා කොළඹදී විරෝධතාවයක් පැවැති අවස්ථාවේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායමක් විසින් ඊට සමගාමීව විරෝධතාවයක් පවත්වමින් ඇය ත්‍රස්තවාදීන්ට සහය දෙන්නියක බව කියවෙන අත් පත්‍රිකා බෙදා හරින ලදී. අදාල ක්‍රියාකාරිනියගේ පුත්‍රයා අතුරුදහන් වී සිටින අතර කිසිදු චෝදනා ගෙනු කිරීමකින් තොරව ඇයව දින 200ක් පුරා රැඳවුම් භාරයේ රඳවා ගෙන ඇත. මෙම ප්‍රතිවිරුද්ධ විරෝධතා ව්‍යාපාරයේදී මානව හිමිකම් ආරක්ෂකයින් 8 දෙනෙකුගේ ඡායාරූප යොදා ඔවුන් දේශද්‍රෝහීන් ලෙස පෙන්වන බැනරයක් ප්‍රදර්ශනය කරන ලදී.

ශිෂ්‍ය ක්‍රියාකාරීන්ද මර්දනයට මුහුණ දුන්හ. මොනරාගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් විරෝධාවයේ නිරත වූ ශිෂ්‍යයන්ට තර්ජනය කර බැනර් පුවරු විනාශ කර දමන ලදී. විශ්ව විද්‍යාල භූමිය පරීක්ෂා කිරීමට සහ ශිෂ්‍ය නියෝජිතයින් සිව් දෙනෙකු පොලීසිය වෙත භාර දෙන ලෙස බල කරමින් බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලය පොලීසිය විසින් වට කරන ලදී. ඌව පළාත් සභා මැතිවරණය කාලය තුළ විපක්ෂ දේශපාලන පක්ෂ වෙත ප්‍රහාර සහ බිය ගැන්වීම් ගණනාවක් එල්ල විය. විපක්ෂ දේශපාලන පක්ෂ වල ක්‍රියාකාරීව කටයුතු කරන රජයේ සේවකයන්ගේ ලැයිස්තු ඉල්ලා සිටි අතර එය දේශපාලන සම්බන්ධතා හේතුවෙන් ඔවුන්ට හිංසා පැනවීමට ගත් මූලික පියවරක් බව පෙණිනි. ආරවුල් ඇතිකරන සහ බෙදුම්වාදීන්ගේ හැඟීම් ධෛර්යමත් කරන බවට ආරක්ෂ අමාත්‍යාංශ ලේකම් වරයා විසින් ප්‍රධාන දෙමළ දේශපාලන පක්ෂයක් වෙත චෝදනා එල්ල කරන ලදී. බ්‍රිතාන්‍ය නියෝජ්‍ය මහ

කොමසාරිස්වරියගේ නැගෙනහිර පළාතේ සංචාරය නිරීක්ෂණයට ලක් කළ අතර ඇයව මුණ ගැසුණු පුද්ගලයන්ව පසුව ප්‍රශ්න කරන ලදී. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරයා මුණ ගැසුණු උතුරේ පවුලක්ද ප්‍රශ්ණ කිරීම් වලට බඳුන් කරන ලදී.

දිගින් දිගටම සිදු වන විසම්මුතිය මර්දනය කිරීමේ සිදුවීම් ආමන්ත්‍රණය කිරීමට වගකිවයුතු පුද්ගලයන් විසින් කිසිදු පියවරක් ගෙන ඇති බව පෙනෙන්නට නොමැත. සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ බොහෝ සිදුවීම් වලට, රජයේ දේශපාලඥයින්, රජයේ නිලධාරීන්, පොලීසිය, ආරක්ෂක හමුදාවන්, රාජ්‍ය පාලිත ජනමාධ්‍ය සහ ජනමාධ්‍යවේදීන් වගකිව යුතු බව පෙණිනි. පොලීසිය වැනි වගකිය යුතු ආයතන වලට මේ සිදුවීම් පිළිබඳ පැමිණිළි කළත් ඔවුන් මෙම සිදුවීම් පිළිබඳ ක්‍රියාත්මත වීමට මැළි විය.

## ශ්‍රී ලංකාවේ විසම්මුමතිය මර්දනය - 2014 සැප්තැම්බර් සිදුවීම් ලැයිස්තුව

| | සිදු වූ දිනය | සිදු වූ ප්‍රදේශය (දිස්ත්‍රික්කය) | සිදුවීමේ ස්වභාවය | මූලාශ්‍රය |
|---|---|---|---|---|
| **A.** රජයට විරුද්ධ බව සැළකෙන පුද්ගලයන්ට මරණ තර්ජන එල්ල කිරීම, හිරිහැර පැමිණවීම, බිය ගැන්වීම | | | | |
| 1. | 2014 සැප් 2 | පුතුකුඩිඉරිප්පු (මුලතිව් දිස්ත්‍රික්කය) | බ්‍රිතාන්‍ය මහකොමසාරිස් හමුවීම හේතුවෙන් මුලතිවුහි දෙමළ පවුලකට තර්ජනය කිරීම | http://tamilguardian.com/print.asp?articleid=12073 |
| 2. | 2014 සැප් 3 | යාපනය දිස්ත්‍රික්කය | සිය කවි සම්බන්ධයෙන් ත්‍රස්ත මර්දන ඒකකය විසින් කතෝලික පූජකවරයෙකුව ප්‍රශ්න කිරීම | http://www.jdslanka.org/index.php/news-features/human-rights/475-sri-lankas-anti-terror-squad-grills-priest-school-teachers-over-tamil-poetry-book |
| 3. | 2014 සැප් 4 | කිලිනොච්චි දිස්ත්‍රික්කය | උයිර්පතිවු නම් වූ කවි පොත තැපෑලෙන් ලැබීම නිසා විදුහල්පතිවරුන්ට වද හිංසා පැමිණවීම | http://www.jdslanka.org/index.php/news-features/human-rights/475-sri-lankas-anti-terror-squad-grills-priest-school-teachers-over-tamil-poetry-book |
| 4. | 2014 සැප් 13 | කොළඹ (කොළඹ දිස්ත්‍රික්කය) | මානව හිමිකම් නීතිඥවරුන් දෙදෙනෙකු බිය වැද්දවීම | http://www.ft.lk/2014/09/16/lawyers-collective-condemns-death-threats-to-attorneys/ |
| 5. | | කොළඹ (කොළඹ දිස්ත්‍රික්කය) | වෘත්තීය සමිති සාමාජිකයින් සහ නායකයින්ට පහර දීම | https://www.facebook.com/lankaenews/posts/787788224619678 |
| 6. | 2014 සැප් 30 | නැගෙනහිර පළාත | නියෝජ්‍ය බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරිය පසු පස යාම සහ නිරීක්ෂණය කිරීම | http://blogs.fco.gov.uk/lauradavies/2014/09/30/looking-over-my-shoulder/ |
| 7. | 2014 සැප් 29 | කොළඹ (කොළඹ දිස්ත්‍රික්කය) | චෝදනා විරහිතව රඳවා තබා ගෙන ඇති අතුරුදහන්වීම් පිළිබද ක්‍රියාකාරිනියක් දේශ ද්‍රෝහියෙකු ලෙස පෙන්වීම | http://www.lankasrinews.com/view.php?220RT403dRX4e2GmEcb284Edd378qbc3tGge42TgJ023dBm3 |
| 8. | 2014 සැප් 29 | කොළඹ (කොළඹ දිස්ත්‍රික්කය) | මානව හිමිකම් ආරක්ෂකයින් ද්‍රෝහීන් යැයි චෝදනා කිරීම | http://srilankabrief.org/2014/09/pro-govt-mob-mocks-leading-civil-society-activists-in-sri-lanka/ |
| **B.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම | | | | |
| 9. | | | අන්තවාදී විරෝධතා නිසා ස්වර්ණ පුස්තක සාහිත්‍ය සම්මානය අහිමි කිරීම | http://srilankabrief.org/2014/09/religious-extremists-threatened-not-to-select-mage-adaraneeya-yakshni-my-beloved-demoness-for-best-novel-award-2014/ |
| 10. | 2014 සැප් 14<br>2014 සැප් 25 | | ස්වර්ණ පුස්තක සාහිත්‍ය සම්මාන තේරීමේ විනිශ්ච මණ්ඩලය ඩොලර් කාක්කෝ, සාම කාක්කෝ ලෙස ලේබල් කිරීම | http://srilankabrief.org/2014/09/religious-extremists-threatened-not-to-select-mage-adaraneeya-yakshni-my-beloved-demoness-for-best-novel- award-2014/ |
| 11. | | අළුත්ම (කළුතර දිස්ත්‍රික්කය) | අළුත්ගම ජාතිවාදී කෝලහල වලින් පසු එහි ඇති තත්ත්වය වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට ආරක්ෂ හමුදා බාධා කිරීම | https://www.youtube.com/watch?v=rqOOIljivig#t=163 |

| | | | | |
|---|---|---|---|---|
| 12. | 2014 සැප් 20 | පරන්තන් සහ කරඩිපොක්කු අතර (කිලිනොච්චි දිස්ත්‍රික්කය) | දෙමළ ජනමාධ්‍යවේදියෙකු ඝාතන ප්‍රයත්නයකින් අනූනමයෙන් ගැලවීම | http://tamilnet.com/art.html?catid=13&artid=37389 |
| 13. | 2014 සැප් | යාපනය (යාපනය දිස්ත්‍රික්කය) | යාපනය ජනමාධ්‍ය නිදහස පිළිබඳ ක්‍රියාකාරිකයෙකුගෙන් ප්‍රශ්ණ කිරීම සහ බිය ගැන්වීම | http://www.tamilnet.com/art.html?catid=13&artid=37400 |
| 14. | 2014 සැප් 22 | හාලිඇල (බදුල්ල දිස්ත්‍රික්කය) | ඌව පළාත් සභා මැතිවරණයෙන් පසු ජනමාධ්‍යවේදීන්ට පහර දීම | http://srilankabrief.org/2014/09/sri-lanka-journalists-assaulted-in-north-and-south/#more-20280 |
| **C.** උතුරු සහ නැගෙන හිර පළාත් වල සිහිකිරීම් සහ යාඥා මෙහෙයන් ට බාධා සහ තර්ජන | | | | |
| 15. | 2014 සැප් 15 | වලිකාමම් උතුර (යාපනය දිස්ත්‍රික්කය) | අතුරුදහන් වූවන් වෙනුවෙන් පැවති යාඥා මෙහෙය හමුදා බිය ගැන්වීම් නිසා දෙවැනි වතාවටත් අවලංගු කිරීම | http://www.tamilguardian.com/article.asp?articleid=12108 |
| 16. | 2014 සැප් 20-21? | යාපනය (යාපනය දිස්ත්‍රික්කය) | රාජිනී තිරාණගම සැමරුම් උත්සවට යාපනයේදී බාධා | http://www.thehindu.com/news/international/south-asia/revisiting-a-tamil-democrats-legacy/article6436119.ece |
| 17. | 2014 සැප් 21 | මඩකලපුව (මඩකලපු දිස්ත්‍රික්කය) | ඝාතනය කරන ලද සිවිල් වැසියන් වෙනුවෙන් වූ සිහිකිරීමේ උත්සවය අධිකරණය විසින් සති දෙකක් තුළ දෙවතාවක් තහනම් කිරීම | http://tamilnet.com/art.html?catid=13&artid=37392 |
| 18. | 2014 සැප් 9 | සතොරකොන්ඩාන් (මඩකලපු දිස්ත්‍රික්කය) | සතොරකොන්ඩාන් හිදී ඝාතනය කරන ලද සිවිල් වැසියන් වෙනුවෙන් වූ සිහිකිරීම අධිකරණය විසින් තහනම් කිරීම | http://tamilnet.com/art.html?catid=13&artid=37375 |
| **D.** සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම් | | | | |
| 19. | 2014 සැප් 15 – 17 | කොළඹ / බැංකොක් | ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා මානව හිමිකම් ආරක්ෂකයින් දෙදෙනෙකුට එවා තිබූ ආරාධනාව අවලංගු කරන ලෙස සිඩ්නි විශ්ව විද්‍යාලයට ආරක්ෂ අමාත්‍යංශයෙන් බලපෑම් | http://www.smh.com.au/world/academic-tells-conference-delegates-not-to-upset-sri-lanka-over-human-rights-20140912-10fzdq.html |
| 20. | 2014 සැප් 27 | මීගමුව (ගම්පහ දිස්ත්‍රික්කය) | තවත් ජනමාධ්‍ය වැඩමුළුවක් පොලීසියේ බිය ගැන්වීම් නිසා අඩාල වීම | http://srilankabrief.org/2014/09/sri-lanka-police-together-with-pro-govt-mob-disrupts-one-more-media-workshop/ |
| 21. | 2014 සැප් | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | සිවිල් සමාජ සම්මන්ත්‍රණයකට බාධා එල්ල වීම සහ නිරීක්ෂණයට ලක් වීම | ජනමාධ්‍ය වල වාර්තා වී නැත |
| 22. | 2014 සැප් 16 | අනුරාධපුර දිස්ත්‍රික්කය | පොලීසිය විසින් සිවිල් සමාජ පුහුණුවක් අවලංගු කිරීම | ජනමාධ්‍ය වල වාර්තා වී නැත |
| 23. | 2014 සැප් 21 | කටුකුරුන්ද (කළුතර දිස්ත්‍රික්කය) | විරෝධතාවයක නිරත වූ කතෝලික පිරිසට කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර | http://www.ucanews.com/news/tear-gas-water-canons-used-on-protesting-sri-lankan-catholics/72006 |

| | | | | |
|---|---|---|---|---|
| **E.** ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය | | | | |
| 24. | 2014 සැප් 14 | මොනරාගල (මොනරාගල දිස්ත්‍රික්කය) | ශිෂ්‍ය කියාකාරකම් වල යෙදුණු විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට මොනරාගලදී තර්ජන | http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7601:sabaragamuwa-students-threatened-at-monaragala-&catid=42:smartphones&Itemid=74 |
| 25. | 2014 සැප් 09 | හෝමාගම (කොළඹ දිස්ත්‍රික්කය) | ශිෂ්‍ය නායකයින් සොයා පොලීසිය විසින් බෞද්ධ සහ පාලි විශ්ව විද්‍යාලය වැටලීම | http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article&id=11835:police-surround-buddhist-and-pali-university-search-for-iusf-representatives&catid=150:lead-news&Itemid=113 |
| **F.** විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය | | | | |
| 26. | 2014 සැප් 19/ 20 | රිදීමාලියද්ද (බදුල්ල දිස්ත්‍රික්කය) | විපක්ෂ දේශපාලන පක්ෂ නායකයෙකුගේ නිවසේ පිහිටි කාර්යාලයට ගිණි තැබීම | http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7626:vidyaratnas-office-at-his-residence-torched&catid=42:smartphones&Itemid=74 |
| 27. | 2014 සැප් 10 | | ඉලංගෙයි තමිල් අරසු කච්චි තර්ජනය උදාසීන කිරීමට ආරක්ෂ අමාත්‍යංශ ලේකම්ට අවශ්‍ය වේ | http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=110143 |
| 28. | 2014 සැප් 19 | ඌව පළාත (බදුල්ල සහ මොනරාගල දිස්ත්‍රික්ක) | අමාත්‍යවරයෙකු විසින් විරුද්ධ පාක්ෂිකයන්ගේ නම් ලැයිස්තුවක් ඉල්ලයි | http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7623:audio-siripala-wants-a-list-jvp-goes-to-hrc&catid=42:smartphones&Itemid=74 |

## A. රජයට විරුද්ධ බව පෙනෙන පුද්ගලයන්ට මර්ණ තර්ජන, හිරිහැර, බිය ගැන්වීම් සහ සීමා

### 1. බ්‍රිතාන්‍ය මහකොමසාරිස් හමු වීම හේතුවෙන් මුලතිව් හි දෙමළ පවුලකට තර්ජන

බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ජෝන් රන්කින් මහතා මුලතිව්හි දෙමළ පවුලක් ඔවුන්ගේ නිවසේදී මුණ ගැසීමෙන් අනතුරුව ශ්‍රී ලංකා යුධ හමුදා ආරක්ෂක අංශ නිලධාරීන් විසින් අදාල පවුලේ සාමාජිකයින්ට තර්ජනය කර තිබුණි. මහකොමසාරිස්වරයා මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිරිප්පු ප්‍රදේශයේ දෙමළ පවුල් මුහුණ දෙන ගැටළු පිළිබද ඔවුන් සමග සාකච්ඡා කිරීමට එහි සංචාරයක නිරත විය. ඔහුගේ පැමිණීමෙන් පසු අදාල නිවස වෙත පැමිණි බුද්ධි අංශ නිලධාරීන් නිවැසියන්ට තර්ජනය කර ඇති බව යාපනයේ උදයන් පුවත්පත වාර්තා කළේය.

http://tamilguardian.com/print.asp?articleid=12073

### 2. තමන් ලියූ කවි පිළිබදව කතෝලික පූජකවරයෙකුගෙන් ත්‍රස්ත විමර්ශන අංශය ප්‍රශ්ණ කරයි.



යුද්ධයේ අවසාන අදියරේදී අනූ නමයෙන් දිවි ගලවා ගත් කතෝලික පූජකවරයෙකු විසින් ලියන ලද උවිර්පත්තිව් නම් වූ කාව්‍ය ග්‍රන්තය පිළිබදව ත්‍රස්ත විමර්ශන අංශය අදාල පූජකවරයාගෙන් ප්‍රශ්ණ කර ඇත. මෙම ග්‍රන්තයේ නමෙහි තේරුම "ජීවිත සටහන්" යන්නයි. යාපනයේ කතෝලික අගරදගුරු තුමාගේ නිවසේදී සැප්තුම්බර් 03 වන දින ත්‍රස්ත විමර්ශන අංශයේ නිලධාරීන් තිදෙනෙකු විසින් ආදාල පූජකවරයා ගෙන් ප්‍රශ්ණ කර ඇත. ප්‍රශ්ණ කිරීම පදනම් වී ඇත්තේ යුද්ධයේ අවසාන මාසයේදී අදාල පූජකවරයා විසින් අත්දකින ලද පල්ලි සහ පාසල් වලට අහසින් එල්ල වූ බෝම්බ ප්‍රහාර පිළිබදව ඔහු විසින් ලියන ලද කාව්‍යයි. උතුර දක්වා දිවෙන A9 මහා මාර්ගය අසල ඉදිවන නව බුදු පිළිම පිළිබදව ඔහු ලියන ලද කවිද ප්‍රශ්න කිරීම් වලට භාජනය විය.

http://www.jdslanka.org/index.php/news-features/human-rights/475-sri-lankas-anti-terror-squad-grills-priest-school-teachers-over-tamil-poetry-book

### 3. උයිර්පත්තිවු නම් වූ කවි පොත තැපෑලෙන් ලැබීම හේතුවෙන් විදුහල්පතිවරුන් වද හිංසා වලට ලක් වේ.

කවි පොත තැපෑලෙන් ලැබීම හේතුවෙන් ඔක්තෝබර් මාසයේ පළමු සතියේදී අවම වශයෙන් කිලිනොච්චියේ විදුහල්පතිවරුන් තිදෙනෙක් වත් ත්‍රස්ත විමර්ශන ඒකකයේ ප්‍රශ්ණ කිරීම් වලට ලක් විය. සැප්තැම්බර් 4 වන දින මාධ්‍ය වෙත අදහස් දක්වමින් ශ්‍රී ලංකා ගුරු සංගමය මෙය දරුණ තත්ත්වයක් බව කියමින් සිදුවීම තරයේ හෙලා දකින ලදී. විදුහල්පතිවරුන් කිහිපදෙනෙකුට මෙම පොත ප්‍රදේශයේ දෙමළ දේශපාලඥයෙකු විසින් තැපෑලෙන් එවා ඇති බව කියැවිණි. "එය සාමාන්‍ය කවි පොතක්. කවි කියවීම නිසා පුද්ගලයන්ව ප්‍රශ්න කරන්නටත් පොලීසිය වෙත කැදවන්නටත් හැකි නම් එමගින් අදහස් ප්‍රකාශ කිරීම පිළිබද උතුරේ පවතින තත්ත්වය පෙනෙනවා." ඔහු කියා සිටියේය.

http://www.jdslanka.org/index.php/news-features/human-rights/475-sri-lankas-anti-terror-squad-grills-priest-school-teachers-over-tamil-poetry-book

### 4. මානව හිමිකම් නීතීඥවරුන් දෙදෙනෙකුට තර්ජන

නීතීඥ සාමූහිකයේ ප්‍රභල සාමාජිකයින් දෙදෙනෙක් වන නාමල් රාජපක්ෂ සහ මංජුල පතිරාජ යන අයට මරණ තර්ජන එල්ල විය. කැළණිය තොරණ මං සන්ධිය අසල පිහිටා ඇති රාජපක්ෂ මහතාගේ නීතීඥ කාර්යාලයට ඇතුළු වූ පුද්ගලයන් දෙදෙනෙකු විසින් 2014 සැප්තැම්බර් 13 වන දින මෙම තර්ජනය කිරීම සිදු කර ඇත. මෙම නීතීඥවරු දෙදෙනාම ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයින් වන අතර මානව හිමිකම් කඩ වූවන් වෙනුවෙන් පෙනී සිටින අය වෙති. මොවුන් ආරක්ෂක අධිකාරීන් ඇතුළු රජයේ සියළු ආයතන වල අත්තනෝමතික ක්‍රියාවන් අභියෝගයට ලක් කරමින් විවාදාත්මක නඩු ගණනාවක් වෙනුවෙන් පෙනී සිටියහ. කාර්යාලයට අනවසරෙන් ඇතුළු වූ මේ පුද්ගලයන්ගෙන් එක් අයෙකු ආයුධ සම්පන්නව

සිට ඇති අතර රාජපක්ෂ මහතාව කොනකට ඇදගෙන ගොස් අනවශ්‍ය නඩු වෙනුවෙන් පෙනී සිටිය හොත් ඔවුන්ව මරා දමන බවට තර්ජනය කර ඇත. රාජපක්ෂ සහ පතිරාජ යන මහත්වරුන් පෙනී සිටි විවාදයට බඳුන් වූ බෞද්ධ භික්ෂුවකට විරුද්ධව ඇති නඩු කිහිපයක් මොවුන් මෙහිදී සදහන් කර ඇත. තර්ජනය කිරීමෙන් අනතරුව මෙම පුද්ගලයන් දෙදෙනා හඳුනා නොගත් මෝටර් සයිලකයක නැගී පලා ගොස් ඇත. රාජපක්ෂ මහතා විසින් මේ සිදුවීම පිළිබදව CIB/III – 230/123 යටතේ පැලියගොඩ පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර ඇත.

http://www.ft.lk/2014/09/16/lawyers-collective-condemns-death-threats-to-attorneys/

## 5. වෘත්තීය සමිති සාමාජිකයන් සහ නායකයිනට පහර දීම




රජයේ මුද්‍රණාලයේ වෘත්තීය සමිතිය විසින් පහර දීම සම්බන්දයෙන් විරෝධතාවයක නිරත වෙමින් [Photo: Daily Mirror]

දේශපාලන පත්වීමක් හරහා පත් වුණු රජයේ මුද්‍රණකරු ලලිත් ද සිල්වා මහතා විසින් මෙහෙයවන ලද කණ්ඩායමක් විසින් විපක්ෂ දේශපාලන පක්ෂ හා බැඳුණු වෘත්තීය සමිති වල සාමාජිකයන් සහ නායකයින්ට පහර දුන් බව වෘත්තී සමිති නායකයෝ චෝදනා කළහ. රජයේ මුද්‍රණාලයට පත්වූ ප්‍රථම බාහිර පුද්ගලයා මොහු කියමින්, දේශපාලන හේතු මත ලලිත් ද සිලවා මහතාව රජයේ මුද්‍රණකරු ලෙස පත් කිරීම පිළිබදව අදාල වෘත්තීය සමිතිය සිය විරෝධය පල කර තිබුණි. පහරදීම හේතුවෙන් වෘත්ති සමිති නායකයින් ගණනාවක් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන ලදී.

https://www.facebook.com/lankaenews/posts/787788224619678

## 6. බ්‍රිතාන්‍ය නියෝජ්‍ය මහ කොමසාරිස් පසු පස යාම සහ නිරීක්ෂණයට බඳුන් කිරීම

තමන්ව නිරීක්ෂණයට ලක් කළ බව සහ තමාව හමුවූ පුද්ගලයන්ව ද විවිධ ප්‍රශ්න කිරීම් වලට බඳුන් වී ඇති බව බ්‍රිතාන්‍ය නියෝජ්‍ය මහකොමසාරිස් ලෝරා ඩේවිස් මහත්මිය ප්‍රකාශ කළේය. මේ අතරින් ඇතැම් සිදුවීම් විකට සිදුවීම් බවත් ඇතැම් ඒවා පුද්ගලයන්ට සහ පවුල් වලට බියජනක ඒවා බවත් ඩේවිස් මහත්මිය කියා සිටියේය. ඇතැම් පුද්ගලයන් තමාව මුණ ගැසීමට බියෙන් පසු වන බව ඇය තවදුරටත් කියා සිටියේය.

http://blogs.fco.gov.uk/lauradavies/2014/09/30/looking-over-my-shoulder/

## 7. රැදවුම් භාරියේ සිටින අතුරුදහන් වීම් පිළිබඳ ක්රියාකාරිනිය ද්රෝහියෙකු ලෙස ලේබල් කිරීම



ඔබ මැය ගැන දන්නවාද?

නම - බාලේන්ද්‍රන් ජෙයකුමාරි

පදිංචිය - කිලිනොච්චිය ප්‍රදේශය

ඉහත විස්තර සඳහන් කාන්තාවගේ පුතුන් තිදෙනාම එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධවී කටයුතු කර ඇති අතර, ඉන් දෙදෙනෙකු යුධ ගැටුම් හේතුවෙන් ජීවිතක්ෂයට පත්වී ඇත. යුද්ධයේ අවසන් සමයේදී බලහත්කාරයෙන් එල්ටීටීඊ සංවිධානයට බඳවාගෙන ඇති මෙම කාන්තාවගේ බාලම පුතුයා අතුරුදහන්වී ඇති අතර, ඒ පිළිබඳව මෙම සැකැත්තිය විසින් ශ්‍රී ලංකා රජයට හා ත්‍රිවිද හමුදාවට චෝදනා කරමින් මානව හිමිකම් වෙනුවෙන් මුදලට පෙනී සිටින කණ්ඩායම් සමග එක්වී රටට විරුද්ධව ක්‍රියාකරමින් සිටියි.

එමෙන්ම එල්ටීටීඊ සංවිධානය නැවත ප්‍රතිසංවිධානය කිරීම සඳහා මෑතකදී ක්‍රියාකල ගෝපි නැමැත්තා හට නවාතැන් පහසුකම් හා රැකවරණය ලබාදෙමින් සිටියදී මෙම කාන්තාවගේ නිවසට ගෝපි නැමැති නව එල්ටීටීඊ නායකයා සොයා පැමිණි පොලිස් නිලධාරියෙකු හට වෙඩිතබා තුවාල සිදුකිරීමට අනුබලදීම හේතුවෙන් මැය මේවන විට අත් අඩංගුවට ගෙන උසාවි නියෝග මත බූස්ස රැඳවුම් කඳවුරේ රඳවා ඇත.

එල්ටීටීඊ සංවිධානය මෙරටින් මුලිනුපුටා දමා තිබියදී මෙවැනි කාන්තාවන් එම සංවිධානය නැවත ප්‍රතිසංවිධානය කිරීම සඳහා කටයුතු කරන පුද්ගලයින් හට උදව් උපකාර කර එම සාමාජිකයින් හට රැකවරණය දී ඇත. එබැවින් මෙම පුද්ගලයින් නිදහස් කිරීම සුදුසුද යන්න ඔබම සිතා බැලිය යුතුය. මෙවැනි අය වෙනුවෙන් ඇමෙරිකන් ඩොලර් වලට පෙනී සිටින්නන් ගැන මෙරටට ආදරය කරන ජනතාව හැටියට ඔබ අවධානයෙන් සිටිය යුතු බවද අප අවධාරයෙන් යුතුව සිහිකර සිටිමු.

දේශමාමක ජාතික ව්‍යාපාරය

ආණ්ඩු පාක්ෂකයින් විසින් බෙදා හැර තිබූ අත් පත්‍රිකාව

2014 සැප්තැම්බර් 29 වන දින කොටුව දුම්රිය පළ ඉදිරිපිට පැවති "ජෙයකුමාරි නිදහස් කරනු" නම් වූ ව්‍යාපාරයට විරුද්ධව පොලීසියේ ආරක්ෂාව ලද 30කගෙන් පමණ සැදුම් ලත් ආණ්ඩු පාක්ෂික කණ්ඩායමක් විසින් විරෝධාවක් පවත්වන ලද බව "ජෙයකුමාරි නිදහස් කරනු" ව්‍යාපාරයට සම්බන්ධ වූ මානව හිමිකම් ආරක්ෂකයින් ප්‍රකාශ කළහ. අතුරුදහන්වීම වලට විරුද්ධ ප්‍රකට ක්‍රියාකාරිනියක් වන බාලේන්ද්‍රන් ජෙයකුමාරි මහත්මිය නිදහස් කරන මෙන් ඉල්ලා මෙම උද්ඝෝෂණ ව්‍යාපාරය සංවිධානය කර තිබුණි. ඇය අතුරුදහන් වූවන් පිළිබඳ සත්‍ය සහ යුක්තිය වෙනුවෙන් හඬනගන්නියකි. ඇගේ පුත්‍රයාද ආරක්ෂක හමුදාවන්ට භාර දීමෙන් පසු අතුරුදහන් වී සිටී. මේ විරෝධතාකරුවන් විසින් ජෙයකුමාරි මහත්මිය එල්ටීටීඊ සංවිධානය නැවත පණ ගැන්වීමට උත්සහ දරන පුද්ගලයන්ට රැකවරණය සැපයූ බව සහ ඇය නිදහස් කිරීමට බල කිරීම ප්‍රශ්න කරමින් අත්පත්‍රිකා බෙදා හරින ලදී. ඇය අතුරුදන් වීම් පිළිබඳ ක්‍රියාකරන්නියක් බව සහ චෝදනා ගොනු නොකර දින 200ක් රැදවුම් භාරයේ තබා ගැනීම පිළිබඳව අත් පත්‍රිකාවේ සඳහන් වූයේ නැත.

## 8. මානව හිමිකම් ආරක්ෂකයින් ද්‍රෝහීන් යැයි චෝදනා කිරීම

ජෙයකුමාරි ව්‍යාපාරය අතරතුර පැවති ඊට විරුද්ධ ව්‍යාපරයේ නිරතු වුණු පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයින් අපහාසයට පත් කරමින් සහ රටේ ද්‍රෝහීන් ලෙස ලේබල් කරමින් ඔවුන්ගේ ඡායාරූප ඇතුළත් බැනර් පුවරු ප්‍රදර්ශනය කළහ. (බැනරයේ දකුණේ සිට වම දක්වා:සියළු ආකාරයේ වෙනස්කොට සැළකීම් සහ වර්ණවාදය පිටු දැකීමේ ජාත්‍යන්තර ව්‍යාපාරයේ (IMADR) සභාපතිනි ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, නීතිඥ සහ රයිට්ස් නව් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ සුදර්ශණ ගුණවර්ධන, ජනමාධ්‍ය වේදී සහ අන්තර්ජාල ජනමාධ්‍යකරුවන්ගේ සංගමයේ කැදවුම්කරු ෆ්‍රෙඩී ගමගේ, ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රයේ උපදේශක සහ ලේඛක රුකී ප්‍රනාන්දු, "අතුරුදහන් වූවන්ගේ පවුල්" සංවිධානයේ සභාපති බ්‍රිටෝ ප්‍රනාන්දු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු , ඇන්ග්ලිකානු පූජකවරයෙකු වන සතිවෙල් පියතුමා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ කැදවුම් කරු සුනිල් ජයසේකර)

http://srilankabrief.org/2014/09/pro-govt-mob-mocks-leading-civil-society-activists-in-sri-lanka/




මානව හිමිකම් ආරක්ෂකයින් අපහාසයට පත් කරමින් ප්‍රදර්ශනය කළ බැනරය [Photo: twitter]

## B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම

### 9. අන්තවාදී විරෝධතා හේතුවෙන් හොඳම නව කතාවට හිමි වීමට තිබුණු සාහිත්‍ය සම්මානය අහිමි වීම

විනිශ්චය මණ්ඩලයේ සිටි විනිශ්චකරුවන්ගෙන් 5 දෙනා ගෙන් 4 දෙනෙක් 2014 හොඳම නවකතාව ලෙස මංජුල වෙඩිවර්ධනගේ මගේ ආදරණීය යක්ෂණී නවකතාව ස්වර්ණ පුස්තක සාහිත්‍ය සම්මානය වෙනුවෙන් තෝරා ගන්නා ලදී. ඔවුන්ගේ තීරණය විනිශ්චකරුවන් සතර දෙනා විසින් සංවිධායකයන් වෙත දැනුම් දී ඇත. කෙසේ වුවත් සිංහල බෞද්ධ අන්තවාදී කණ්ඩායම් වල බලපෑම් හේතුවෙන් සාහිත්‍ය සම්මානය වෙනත් නවකතාවක් වෙත පිරිනමන ලදී. අන්තවාදී ලේඛකයන් විසින් මෙම නවකතාව ජාති විරෝදී එකක් ලෙස ලේබල කළ අතර ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය පළ කළ ලිපි මගින් එහි ලේඛක මංජුල වෙඩිවර්ධනව ද්‍රෝහියෙකු ලෙස හඳුන්වා දී තිබුණි. ජනමාධ්‍යවේදියෙකු, මානව හිමිකම් ආරක්ෂකයෙකු සහ සම්මානලාභී ලේඛකයෙකු වන මංජුල වෙඩිවර්ධන ජීවිතයට එල්ල වූ තර්ජන හේතුවෙන් 2009 වර්ෂයේ සිට රටින් පිටුවහල් වී ජීවත් වෙයි. වෙඩිවර්ධනගේ ග්‍රන්තයට සම්මානය පිරිනැමුවහොත් සම්මාන උත්සවයට කඩා පනනි බවට අන්තවාදී කණ්ඩායම විසින් තර්ජනය කර තිබුණි.

http://srilankabrief.org/2014/09/religious-extremists-threatened-not-to-select-mage-adaraneeya-yakshni-my-beloved-demoness-for-best-novel-award-2014/
ගුණදාස අමරසේකර විසින් ලියන ලද සිංහල ලිපිය -
http://www.lakbima.lk/index.php?option=com_content&view=article&id=39610:2014-09-12-12-32-43&catid=48:2012-04-02-08-50-52&Itemid=75




[Photo; Manjula Wediwardana Face Book]

## 10. ස්වර්ණ පුස්තක සාහිත්‍ය සම්මානය තේරීමේ විනිශ්ච මණ්ඩලය "ඩොලර් කාක්කන් සහ සාම කාක්කන් " ලෙස හංවඩු ගැසීම

"විනිශ්ච මණ්ඩලයට පත් කරන වැඩි දෙනෙක් එන්ජීඕ වල අය. ඔවුන් ඩොලර් කාක්කෝ, සාම කාක්කෝ. ඒ අය අහිංසක නෑ. ඒ අයට වෙනම න්‍යායපත්‍ර තියෙනවා.මෑතකදී පැවති සාහිත්‍ය සම්මාන උළෙලකදී මේ බව හොඳින් පැහැදිළි වුණා. කොටින්ගේ ඒජන්තවරයෙකු ලියලා තියෙන පොතක් එන්ජීඕ විනිශ්ච මඩුල්ල විසින් සම්මානට තොරාගෙන ඇති බව මට දැනගන්න ලැබුණා. අපිට මෙයට ඉඩ දෙන්නට බැහැ. මෙය භයානකයි" යනුවෙන් 2014 සැප්තැම්බර් 14 වන දින ලක්බිම ඉරිදා සංග්‍රහයට ලිපියක් ලියමින් න්‍යායවාදියෙකු සහ සිංහල දේශප්‍රේමියෙකු ලෙස පෙනී සිටින ආචාර්ය ගුණදාස අමරසේකර ප්‍රකාශ කර තිබුණි. මෙසේ චොදනා වලට ලක් වූ විනිශ්චකරුවන් වූයේ ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන, ආචාර්ය හර්ෂණ රඹුක්වැල්ල, ලයනල් ප්‍රනාන්දු සහ සමන් වික්‍රමාරච්චි යන මහත්වරුයි.

http://srilankabrief.org/2014/09/religious-extremists-threatened-not-to-select-mage-adaraneeya-yakshni-my-beloved-demoness-for-best-novel-award-2014/

සිංහල ජාතිවාදී ලේඛකයෙකු වන සේන තෝරදෙනිය මහතා විසින් දිවයින දිනපතා පුවත්පතේ පළ කළ ලිපියක් මගින් මංජුල වෙඩිවර්ධන සහ විනිශ්ච මණ්ඩලේයේ සාමාජිකයින්ව බෙදුම්වාදීන් ලෙස හඳුන්වා තිබුණි.
http://www.divaina.com/2014/09/25/sarasavi%204.html

## 11. අළුත්ගම ජාතිවාදී කෝලහල වලින් පසු එහි ත්තත්වය වාර්තාකිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට ආරක්ෂ හමුදාවන්ගේ අවහිරතා

ලංකා ඉරිදා නම් වූ සතිපතා පුවත් පතේ ජනමාධ්‍යවේදීන්ව අළුත්ගම මුස්ලිම් ප්‍රදේශයේ රදවා ඇති ආරක්ෂක හමුදා විසින්, අදලා ප්‍රදේශය හමුදා ජෙනරාල් සහ හමුදා නීතිය යටතේ පවතින බව කියමින් අවහිර කර තිබුණි. "මෙය සිවිල් පාලන ප්‍රදේශයක් නොවෙයි, ඒ නිසා පූර්ව අවසරයකින් තොරව මේ ප්‍රදේශයට ඇතුළු වන්න බැහැ" යැයි ආරක්ෂක හමුදා පොලීසියේ සහ ආරක්ෂක හමුදාවේ සාමාජිකයින් විසින් පවසන ආකාරය දැක්වෙන වීඩියෝ පටයක් ලංකා ටෲත් වෙබ් අඩවියේ පළ විය.

http://srilankabrief.org/2014/09/religious-extremists-threatened-not-to-select-mage-adaraneeya-yakshni-my-beloved-demoness-for-best-novel-award-2014/

අවහිර කිරීම දැක්වෙන් වීඩියෝව මෙතැනින් https://www.youtube.com/watch?v=rqOOIIjivig#t=163 (මිනිත්තු 2.12 - 2.45)




"මෙය හමුදා පාලනය යටතේ ඇති ප්‍රදේශයක්, පූර්ව අවසරයකින් තොව ජනමාධ්‍යදීන්ට ඇතුළුවීම තහනම්" නිලධාරියෙකු විසින් ජනමාධ්‍යවේදීන්ට පවසන අයුරු [Photo: screen shot of the Lanka Irida video]

## 12. උතුරේ දෙමළ ජනමාධ්‍යවේදියෙක් ඝාතන තැතකින් බේරෙයි

ආරක්ෂක අංශ වලට සම්බන්ධ යැයි සැළකෙන පුද්ගලයන් දෙදෙනෙකු විසින් 33 හැවිරිදි සින්නරාසා සිවන්තිරම් නැමති ජනමාධ්‍යවේදියාව ඝාතනය කිරීමට උත්සහ කළැයි සැක කෙරේ. ඔහු යාපනයේ දිනපතා පුවත්පතක් වන උදයන් පුවත්පතේ ප්‍රාදේශීය වාර්තාකරුවෙකි. පුවත්පත් කාර්යාලයේ සේවය අවසන් වී සිය බයිසිකලයෙන් A9 මාර්ගය ඔස්සේ නිවස බලා යමින් සිටි සිවන්තිරම් මහතාව මුහුණු ආවරණ පැළඳ ගත් පුද්ගලයන් දෙදෙනෙකු විසින් නවත්වා ඇත. ඔවුන් පොලිස් අපරාධ විමර්ශණ අංශයෙන් බව පවසමින් ඔහුගෙන් මිනිත්තු 10ක් පමණ ප්‍රශ්න කර ඇත. සිවන්තිරම් මහතාට පහරදීමෙන් පසු ඔහුව මාර්ගයේ ධාවනය වන බස් රථයකට ඇද දමා ඝාතනය කොට එය සාමාන්‍ය මාර්ග අනතුරක් ලෙස පෙන්වීමට උත්සහ කොට තිබුණි. කෙසේ වෙතත් ඊලගට ආ වාහනයේ රියැදුරු මාර්ගය මැද සිටි සිවන්තිරම් මහතා ව මගහැර වාහනය ධාවනය කරීම නිසා ඔවුන්ගේ උත්සහ ව්‍යාර්ථ වී ඇත. අසල තිබූ ආපන ශාලාවක් වෙත දිව යාමට සිවන්තිරම් මහතාට හැකි වී ඇති අතර එහි සිටි ජනතාවට ඔහු පසුපස හඹා එන මුහුණු ආවරණ පැළඳගත් පුද්ගලයන් දෙදෙනා ව අල්ලා ගැනීමට සූදානම් වී ඇත. මින් එක් අයෙක් තමා වාහනයට තල්ලු කිරීමට ප්‍රථමයෙන් මුහුණ ආවරණය ගැලවූ බවත් ඒ පුද්ගලයාව තමාට හඳුනාගත හැකි බවත් සිවන්තිරම් මහතා සිය පොලිස් පැමිණිල්ලේ සදහන් කර ඇත.

http://tamilnet.com/art.html?catid=13&artid=37389

## 13. යාපනයේ මාධ්‍ය නිදහස පිළිබද ක්‍රියාකාරිකයෙකු ප්‍රශ්ණ කිරීම සහ බිය ගැන්වීම

යාපනයේ මාධ්‍ය නිදහස පිළිබද ක්‍රියාකාරිකයෙකු වන ත්‍යාපරන් රත්නම් මහතා ත්‍රස්ත විමර්ශන ඒකකය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආරක්ෂක අමාත්‍යංශ යටතේ ඇති විමර්ශන අංශ වල ප්‍රශ්න කිරීම වලට, බියගැන්වීම්වලට සහ හිරිහැර වලට නොකඩවා ලක් වී ඇති බව මාධ්‍ය වාර්තා කළේය. උතුරේ දෙමළ ජනමාධ්‍යවේදීන් කොළඹ සහ වෙනත් පළාත් වල පැවැත්වීමට නියමිතව තිබූ ජනමාධ්‍ය වැඩමුළු වලට සහභාගී වීමට උත්සහ දැරීමෙන් පසුව මේ ප්‍රශ්ණ කිරීම්, බියගැන්වීම් සහ හිරිහැර ආරම්භ වී ඇත. ත්යාපරන් මහතා ජනමාධ්‍ය වැඩමුළුවකට සහභාගී වීමට කොළඹ බලා යමින් සිටියෙදී පොලීසිය සහ හමුදාව විසින් නවත්වන ලද ජනමාධ්‍යවේදීන් අතුරින් එක් අයෙකි. රජයට සහය දෙන යැයි සැළකෙන කළහකාරී කණ්ඩායමක විරෝධතා සහ තර්ජන හේතුවෙන් මෙම පුහුණු වැඩමුළුව අවලංගු කරන ලදී. ජාත්‍යන්තර ජනමාධ්‍ය මුර පල්ලන් , දකුණේ ජනමාධ්‍යවේදීන් සමග පැවැත්වෙන පුහුණු වැඩමුළු සහ මාධ්‍ය නිදහස වෙනුවෙන් යාපනයේ දී පැවැත්වුණු විරෝධතාවයක් පිළිබදව ත්‍යාපරන් මහතාගෙන් ප්‍රශ්ණ කර ඇති බව මාධ්‍ය වාර්තා කළේය. ත්‍යාපරන් මහතා යාපනය

ජනමාධ්‍ය සංසදය හා සම්බන්ධව කටයුතු කරයි. එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධව කටයුතු කර ඇතැයි කරන ලද අසත්‍ය චෝදනාවක් සම්බන්ධයෙන්ද ප්‍රශ්ණ කළ බව ද වාර්තා විය.

http://www.tamilnet.com/art.html?catid=13&artid=37400

## 14. බදුල්ල පළාත් සභා මැතිවරණයෙන් පසු ජනමාධ්‍යවේදීන්ට ප්‍රහාර

ශ්‍රී ලංකා නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට අනුව 2014 සැප්තැම්බර් 22 වන දින රජයේ දේශපාලඥයින් විසින් මෙහෙයවන ලද මැර කණ්ඩායමක් විසින් බදුල්ල හාලිඇල ප්‍රදේශයේදී ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු ට පහර දී ඇත. එම්ටීවී හි චන්දන කුරුප්පුආරච්චි සහ ස්වර්ණවාහිණියේ සහ බදුල්ල දිනපතා ලංකාදීප වාර්තාකරු පාලිත ආරියවංශ මෙසේ පහරකෑමට ලක් වී ඇත. මෙම සිදුවීම උව පළාත් සභා මැතිවරණයෙන් (2014 සැප් 20) පසු රජයට සහය දෙන මැර පිරිස් විසින් විරුද්ධ පාක්ෂික දේශපාලඥයින් වෙත මුදා හරින ලද පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි කොටසක් බව බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය චෝදනා කළේය. පහරකෑමෙන් ලද බලපතල තුවාල හේතුවෙන් මාධ්‍යවේදී චන්දන කුරුප්පුආරච්චි මහතා බදුල්ල රෝහලට ඇතුළත් කළ අතර වැඩිදුර ප්‍රතිකාර සඳහා පෞද්ගලික රෝහලකට ඇතුළත් කරන ලදී.

http://srilankabrief.org/2014/09/sri-lanka-journalists-assaulted-in-north-and-south/#more-20280

# C. උතුර සහ නැගෙනහිර පළාත් වල පැවැත්වීමට නියමිතව තිබූ ගුණ සැමරුම් සහ යාඥා මෙහෙයන්ට බාධා සහ තර්ජන

## 15. ආරක්ෂක හමුදා බියගැන්වීම නිසා අවතැන් වූවන් වෙනුවෙන් පැවැත්වීමට තිබූ යාඥා මෙහෙය දෙවැනි වතාවටත් අවලංගු කෙරේ

යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් උතුර ප්‍රදේශයේ අවතැන් වූවන් වෙනුවෙන් පැවැත්වීමට තිබූ යාඥා මෙහෙය ආරත්ෂක හමුදාවන්ගේ බිය ගැන්වීම් හේතුවෙන් දෙවැනි වතාවටත් අවලංගු කිරීමට සිදු විය. වලිකාමම් උතුරු ප්‍රදේශයේ අවතැන්වූවන් වෙනුවෙන් 2014 සැප්තුම්බර් 5 වන දින පැවැත්වීමට යොදා තිබූ යාඥා මෙහෙය පැවැත්වුවහොත් එහි ප්‍රතිවිපාක ලැබෙනු ඇතැයි ආරක්ෂක හමුදා විසින් එහි සංවිධායකයන්ට තර්ජනය කර තිබේ. මෙම යාඥා මෙහෙය සබපතිපිලෙ සුහ සාධන කේන්ද්‍රයේ පැවැත්වීමට නියමිතව තිබුණු අතර ආරක්ෂ හමුදා බුද්ධි අංශ විසින් අදාල ස්ථානයට පැමිණ යාඥා මෙහෙය වෙනුවෙන් සකස් කර තිබූ මඩුව ඉවත් කරන මෙන අණ කර ඇත. ඒ වන විටත් යාඥා මෙහෙය සඳහා කටයුතු සූදානම් වෙමින් පැවතිණි.

http://www.tamilguardian.com/article.asp?articleid=12108

## 16. යාපනයේදී රාජිණී තිරාණගම සැමරුම් උත්සවයට බාධා

ආචාර්ය රාජිණී තිරාණගම ගේ ගුණ සැමරීම සඳහා ඇගේ සහායකයන්, සංවිධාන සහ පවුලේ සාමාජිකයන් විසින් සංවිධානය කළ වැඩසටහනට ලබා ගෙන තිබූ ස්ථාන අහිමි කරන ලද අතර වැඩසටහනේ කොටසක් ලෙස පැවැත්වීමට නියමිතව තිබුණු සාමකාමී පාගමන යාපනය පොලීසිය විසින් තහනම් කරන ලදී. ආචාර්ය රාජිණී තිරාණයම යාපනය මානව හිමිකම් සඳහා වන විශ්ව විද්‍යාල ආචාර්යවරු නම් වූ එකමුතුවේ ආරම්භක සාමාජිකාවකි. වසර 25කට පෙර 1989 සැප්තැම්බර් 21 වන දින එල්ටීටීඊ සංවිධානය විසින් ඇයට වෙඩි තබා ඝාතනය කරන ලදී. ඇගේ ගුණ සැමරුම් උත්සවය සඳහා එහි සංවිධායකයින් විසින් ආචාර්ය තිරාණගම සේවය කළ යාපනය විශ්ව විද්‍යාලයේ ශාලාවක් වෙන් කර තිබී ඇති අතර පා ගමන පැවැත්වීම සඳහා පොලීසිය විසින් අවසර ලබා ගෙන තිබූ ඇත. කෙසේ වුවද වැඩසටහනට දින කිහිපයකට පෙර මේ අවසරයන් දෙකම අවලංගු කර තිබුණි. පසුව, යාපනය මහජන පුස්තකාලයේදී පැවැත්වීමට සූදානම් කර තිබූ දේශනය සඳහා ලබා ගෙන තිබූ අවසරයද නගරසභා බලධාරීන් විසින් අවලංගු කරන ලදී. අවසානයේදී අදාල වැඩසටහන් පල්ලියක පැවැත්වීමට කටයුතු කර තිබුණි. එහිදී දි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් යැයි කියා ගත් පුද්ගලයන් දෙදෙනෙකු එහි පැමිණ අදාල වැඩසටහන

පිළිබඳව විස්තර සටහන් කර ගෙන ගොස් ඇත. ආචාර්ය තිරාණගමගේ සැමියා වන දයාපාල තිරාණගම මහතාව යාපනයේ හමුදා අණදෙන නිලධාරී විසින් ප්‍රශ්ණ කිරීම සඳහා කැඳවා තිබුණි.

http://www.thehindu.com/news/international/south-asia/revisiting-a-tamil-democrats-legacy/article6436119.ece

## 17. මඩකළපුවේදී ඝාතනය කළ සිවිල් වැසියන්ගේ ගුණ සැමරුම අධිකරණය විසින් සති දෙකක් තුළ දෙවතාවක් අත්හිටුවයි

මහජන සාමයට බාධා ඇති විය හැකිය යන පදනමෙන් අධිකරණ තහනම් නියෝගයක් ලබා ගෙන 2014 සැප් 21 දිනට යෙදී තිබුණු ගුණ සැමරුම් උත්වය මඩකළපුව පොලීසිය විසින් සති දෙකක් තුළ දෙවැනි වාතාටත් නවතා දැමූ බව වාර්තා විය. (පලමු සිදුවීම සඳහා පහත බලන්න) 1990 පුදුකුඩිඉරිප්පු සමූල ඝාතනයේ දී මිය ගිය පුද්ගලයන් 17 දෙනොගේ පිළිරුව අසල පැවති සිහිකිරීමේ උත්සවයට සහභාගී වූ එහි වින්දිතයන් ගේ පවුල් වල සාමාජිකයන්ට හිරිහැර වලට මුහණ දීමට සිදු වී ඇත. මේ සිවිල් වැසියන් 17, 1990 දී ග්‍රාමාරක්ෂක භාටයන් විසින් වෙඩි තබා ඝාතනය කෙරුණු බවට වාර්තා විය. අදාල සිහිකිරීමට සහභාගී වූවන් ඉටිපන්දම් දැල්වීම ආරම්භ කළ අවස්ථාවේ පොලිස් නිලධාරීන් විසින් ඔවුන් ලබාගත් අධිකරණ නියෝගය පෙන්වමින් ගැණ සැමරුමට බාධා එල්ල කර ඇත. ඝාතනය කරන ලද පුද්ගලයන් වෙනුවෙන් පන්දම් දැල්වීමට කෝවිලක් සොයා ගන්නා ගෙන සහභාගී වූ වන්ට පොලීසිය විසින් දැනුම් දී ඇත. පසුව, රැස්ව සිටි පිරිස අසල තිබූ කෝවිලක් වෙත ගොස් ඇති අතර එහිදී ඔවුන් බිය ගැන්වීම සඳහා කැරලි මර්ධන පොලීසිය යොදවා තිබුණි.

http://tamilnet.com/art.html?catid=13&artid=37392

## 18. සතරකොන්ඩාන් හිදී ඝාතනය කෙරුණු සිවිල් වැසියන් සිහිපත් කිරීමේ උත්සවය තහනම් කිරීමට අධිකරණ නියෝග



ප්‍රදේශයේ සාමයට බාධා විය හැකි ය යන පදනමෙන් පොලීසිය විසින් අධිකරණ තහනම් නියෝගයක් ලබා ගෙන තිබුණි (Photo: BBC Sandeshaya)

මඩකලපුව සතරකොන්ඩාන් හිදී ඝාතනය කෙරුණු සිවිල් වැසියන් වෙනුවෙන් සැප්තැම්ර් 09 වන දින පැවැත්වීමට යොදා තිබුණු ගුණ සැමරුම් උත්සවය අධිකරණය විසින් නවතා දැමූ බව වාර්තා විය. මෙවැනි ගැණ සැමරුමක් මගින් ප්‍රදේශයේ සාමයට බාධා විය හැකි බව පොලීසිය විසින් අධිකරණයට දැනුම් දී තිබුණු බව වාර්තා විය. ඝාතනය කෙරුණු පුද්ගලයන්ගේ ස්මාරකය අසල පහන් දැල්වීමට ඉඩ නොදීම සම්බන්ධයෙන් වින්දිතයන්ගේ පුවල් වල සාමජිකයන් සිය කණගාටුව පළ කර තිබුණි.

http://tamilnet.com/art.html?catid=13&artid=37375

## D. රැස්වීමේ නිදහස උල්ලංඝණය කිරීම

### 19. ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා මානව හිමිකම් ආරක්ෂකයින් දෙදෙනෙකු වෙත එවා තිබුණු ආරාධනය අවලංගු කරන ලෙස ආරක්ෂක අමාත්‍යංශය සිඩ්නි විශ්ව විද්‍යාලයට බල කරයි

ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් සඳහා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයින් දෙදෙනෙකු වෙත සිඩ්නි විශ්ව විද්‍යාලය විසින් එවා තිබුණු ආරාධනාව ආරක්ෂක අමාත්‍යංශයේ බල කිරීම මත අදාල විශ්ව විද්‍යාලය විසින් අවලංගු කරන ලදී. 2014 සැප්තැම්බර් 15 සිට 17 දක්වා බැංකොක් හිදී පැවැත්වීමට නියමිත වූ මෙම සම්මන්ත්‍රණයේ මාතෘකාව වූයේ "මානව හිමිකම් උසස් කිරීම සහ ආසියානු - පැසිපික් කළාපයේ ආරක්ෂාව" යන්නයි. ("Enhancing Human Rights and Security in the Asia Pacific") මෙම සිදුවීමට විරෝධය දක්වමින් අදාල සම්මන්ත්‍රණය සඳහා ආරාධනා ලබා සිටි අනෙක් ශ්‍රී ලංකීය රාජ්‍ය නොවන සංවිධානය සහ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන කිහිපයක්ම එයට සහභාගී වීමෙන් වැළකී සිටියේය. මෙසේ ආරක්ෂක අමාත්‍යංශයේ බලපෑමෙන් ආරාධනාව අවලංගු වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයින් දෙදෙනෙකු වන 'Right to Life' සංවිධානයේ බ්‍රිටෝ ප්‍රනාන්දු සහ රයිට්ස් නව් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ සුදර්ශන ගුණවර්ධන යන මහත්වරුන්ය. මේ දෙදෙනාම දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියේ රජය විවේචනය කර ඇත. සම්මන්ත්‍රණයට සහභාගීවී සිටි ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා නියෝජිතයින් විවේචනය නොකරන ලෙස ද සම්මන්ත්‍රණයේ සංවිධායකයින් විසින් සෙසු ජාත්‍යන්තර නියෝජිතයන්ට දැනුම් දී ඇත. ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් නගන ලද චෝදනා වල නීත්‍යානුකූල භාවය ප්‍රශ්ණ කිරීමට අප කාටත් වුවමනා වුවත් ඉතා සුළු ධනාත්මක වෙනසක් ඇති කළ හැකි එවැනි ප්‍රශ්න කිරීම් තුළින් සම්මන්ත්‍රණයට වැඩි හානියක් ඇති විය හැකි නිසා ඒ ගැන ගැඹුරින් සිතා බලා කටයුතු කරන මෙන් සංවිධායකයන් විසින් සම්මන්ත්‍රණයට පැමිණි නියෝජිතයන් වෙත දැනුම් දී ඇත.



සුදර්ශන ගුණවර්ධන (වම් පස) බ්‍රිටෝ ප්‍රනාන්දු (දකුණේ) (Photo: Internet)

http://www.smh.com.au/world/academic-tells-conference-delegates-not-to-upset-sri-lanka-over-human-rights-20140912-10fzdq.html

සිඩ්නි විශ්ව විද්‍යාලයෙන් එවන ලද ලිපියක පිටපතක් http://srilankabrief.org/wp-content/uploads/2014/09/Deinvite-letter-to-Right-to-Life.pdf

### 20. තවත් ජනමාධ්‍ය වැඩමුළුවකට පොලීසියෙන් බාධා

මීට පෙර අවස්ථා දෙකකදී ජනමාධ්‍ය වැඩමුළු නවතා දැමීමට මුල් වුණු "ජාතිය ගොඩනැංවීමේ එකමුතුව" නැමති ඊනියා නම යොදා ගෙන රාජ්‍ය බුද්ධි අංශ විසින් තවත් ජනමාධ්‍ය වැඩමුළුවකට තර්ජනය කර එය නවතා දමන ලදී. අදාල ජනමාධ්‍ය වැඩමුළුව පැවැත්වුවහොත් ජනමාධ්‍යවේදීන්ට පාඩමක් ඉගැන්වීමට කටයුතු කරන බව පවසමින් ජාතිය ගොඩනැංවීමේ

එකමුතුවට අයත් මැර කණ්ඩායමක් විසින් තර්ජනය කර ඇත. හිටපු හමුදා භටයින් මෙම මැර කණ්ඩායම අයත් වූ බව කියැවේ. වෘත්තීය අන්තර්ජාල ජනමාධ්‍යකරුවන්ගේ සංගමයේ කැඳවුම්කරු වෙත දුරකතන ඇමතුමක් ලබා දී ත්‍රස්ත මර්දන ඒකකයේ නිලධාරියෙක් විසින් ඔහුට දැනුම් දී ඇත්තේ ජාතිය ගොඩනැංවීමේ එකමුතුව නැමති කණ්ඩායමක් විසින් ජනමාධ්‍ය වැඩමුළුව පැවැත්වීමට නියමිතව තිබූ මීගමුවේ රානි බීච් හෝටලය වැටලීමට සූදානම් වන බවයි. වැඩමුළුවට සහභාගීවන්නන්ගේ ආරක්ෂාව පිළිබඳ පොලීසියට සහතික විය නොහැකි බව එහිදී දැනුම් දී ඇත. මෙම වැඩමුළුව නැවැත්වීමට ඉක්මන් පියවර ගන්නා ලෙස පොලිස් නිලධාරියෙකු විසින් හෝටලේ අයිතිකරු වෙත පසුව තර්ජනය කර ඇත. මෙම තර්ජනය කිරීම් සහ බියගැන්වීම් වලින් පසුව වැඩමුළුව නම හෙළි නොකළ ස්ථානයකට ගෙන යාමට එහි සංවිධායකයින්ට සිදු විය.
http://srilankabrief.org/2014/09/sri-lanka-police-together-with-pro-govt-mob-disrupts-one-more-media-workshop/

## 21. සිවිල් සමාජ සම්මන්ත්‍රණයකට බාධා සහ එය නිරීක්ෂණයට

සිවිල් සංවිධාන දෙකක් විසින් ත්‍රිකුණාමලයේදී පැවැත්වීමට සූදානම් කර තිබූ රැස්වීමකට බුද්ධි අංශ නිලධාරීන් විසින් බාධා කර ඇති බව ඉන්ෆෝම් වෙත වාර්තා වී ඇත. මේ සඳහා වෙන් කර තිබුණු ස්ථානය අදාල රැස්වීම සඳහා ලබා නොදෙන ලෙස බුද්ධි අංශ නිලධාරීන් විසින් එහි සේවකයන්ට බල කර ඇත. රැස්වීමේ සංවිධායකයින් විසින් රැස්වීම සඳහා වෙනත් ස්ථානයක් වෙන් කරවාගත්තද එයට ද එල්ල වූ බාධා හේතුවෙන් අදාල රැස්වීම තුන්වෙනියට ලබා ගත් ස්ථානයක පැවැත්වීමට සිදුව ඇත. බුද්ධි අංශ නිලධාරීන් විසින් මෙම රැස්වීමද නිරීක්ෂණයට ලක් කර තිබුණි.

## 22. පොලීසිය විසින් සිවිල් සමාජ පුහුණු වැඩසටහන අවලංගු කරයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේදී පැවැති පුහුණු වැඩමුළුව අතරමග දී අවලංගු කිරීමට 2014 සැප්තැම්බර් 16 වන දින පොලීසි විසින් බල කර ඇති බව ඉන්ෆෝම් වෙත වාර්තා වේ. උතුරේ ක්‍රියාකාරීන් වෙනුවෙන් කොළඹ පිහිටි මානව හිමිකම් සංවිධානයක් විසින් මෙම පුහුණු වැඩමුළුව සූදානම් කොට තිබුණි. වැඩමුළුව පැවැත්වුනේ ප්‍රකට රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පවත්වාගෙන් වන ගොඩනැගිල්ලකය.

## 23. විරෝධතාවයේ නිරත වුණු කතෝලික ප්‍රජාවට කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර

පොලීසිය විසින් ගලවා ඉවත් කරන ලද පිළිමයක් නැවත ලබා දෙන ලෙස ඉල්ලමින් සාමකාමී විරෝධතාවයක යෙදුණු 3000ක පමණ කතෝලික බැතිමතුන් පිරිසක් විසුරුවා හැරීමට සැප්තැම්බර් 21 වන දින පොලීසිය ජල ප්‍රහාර සහ කඳුළු ගෑස් යොදා ගත්හ. කළුතර කටුකුරුන්ද ශාන්ත පිලිප් නේරි පල්ලිය ඉදිරිපිට රජයට අයත් ඉඩමක ඉදි කර තිබුණු ශාන්ත පිලිප් නේරි තුමාගේ පිළිමය බෞද්ධ භික්ෂූන් පිරිසකගේ පැමිණිල්ලකින් පසුව පොලීසිය විසින් ඉවත් කර ඇත. මේ ඉදිකර ඇත්තේ අදාල නිළධාරීන්ගෙන් අවසර නොගෙන බව පැමිණිල්ලේ සඳහන් වී ඇත. “ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බහුතරයට පමණක් නොව සියළු දෙනාටම සමානව ආගමික නිදහස ලබා දී තිබෙනවා. අදාල ස්ථානයේ පිළිමය තැන්පත් කිරීමට කතෝලික බැතිමතුන්ට සම්පූර්ණ අයිතියක් තියෙනවා” යනුවෙන් අත්තිඩිය කතෝලික පියතුමා ucanews.com. වෙත ප්‍රකාශ කොට ඇත.
http://www.ucanews.com/news/tear-gas-water-canons-used-on-protesting-sri-lankan-catholics/72006

# E. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

## 24. විරෝධතාවයක නිරත වූ ශිෂ්‍යයන්ට මොණරාගලදී තර්ජන

සබරගමුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින් මොනරාගල නගරයේදී උද්ඝෝෂණයක නිරත වෙමින් සිටි අතරතුර මොණරාගල ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා විසින් ශිෂ්‍යයන්ට තර්ජනය කර බැනර් පුවරු විනාශ කර දමා ඇත. මොනරාගල ප්‍රාදේශීය සභාවේ බලය පලක එක්සත් ජනතා නිදහස් සන්ධානය සතු වේ. ශිෂ්‍ය සංගමය සහ පීඨ සංගමය නැවත පිහිටුවන ලෙස බල

කරමින් සබරගමුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් විසින් සති දෙකක් පමණ තිස්සේ විශ්ව විද්‍යාලය අසල විරෝධතාවයක නියැලී සිටියහ. මොනරාගල නගරයේදී පැවති උද්ඝෝෂණයේ අරමුණු වූයේ ශිෂ්‍ය ඉල්ලීම් පිළිබඳ මහජනයා දැනුවත් කිරීමයි.
http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7601:sabaragamuwa-students-threatened-at-monaragala-&catid=42:smartphones&Itemid=74

### 25. ශිෂ්‍ය නායකයින් සොයා පොලීසිය විසින් බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය වටලයි

විශ්ව විද්‍යාල භූමිය පරීක්ෂා කිරීමට අවශ්‍ය බව කියමින් පොලීසිය, කැරලි මර්දන ඒකකය සමග එක්වී බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය වැටළු බව වාර්තා විය. විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට පොලීසිය විසින් අධිකරණ නියෝගයක් ලබා ගෙන තිබුණි. විශ්ව විද්‍යාල භූමිය පරීක්ෂා කිරීමට අවසර ඇත්තේ විශ්ව විද්‍යාල අධිකාරීන්ට පමණක් බව බෞද්ධ ශිෂ්‍ය භික්ෂූන් විසින් පොලීසියට දැනුම් දුන් අවස්ථාවේ පොලීසිය විසින් පවසා ඇතිතේ ඔවුන් අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ ශිෂ්‍ය නායකයින්ව සොයන බවයි.
http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article&id=11835:police-surround-buddhist-and-pali-university-search-for-iusf-representatives&catid=150:lead-news&Itemid=113

## F. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය

### 26. නිවසේ පවත්වාගෙන ගිය විරුද්ධ පාක්ෂයේ නායකයාගේ කාර්යාලයට ගිණි

ඌව පළාත් සභා මැතිවරණයේ ජනතා විමුක්ති පෙරමුණු කණ්ඩායම් නායක සමන්ත විද්‍යාරත්නගේ මැතිවරණ කාර්යාලයට ගිණි තබා ඇති බව වාර්තා විය. 2014 සැප්තැම්බර් 19 වන දින මධ්‍යම රාත්‍රියේදී රිදීමාලියද්ද ප්‍රදේශයේ පිහිටා ඇති ඔහුගේ නිවසේ පිහිටා තිබූ මැතිවරණ කාර්යාලට කඩා වැදි මැර කණ්ඩායමක් විසින් එහි තිබූ බඩු බාහිරාදිය විනාශ කොට දැමා ඇත. ඌව පළාත් සභා මැතිවරණය පැවැත්වුණු සැප්තැම්බර් 20 වන දින උදෑසන නැවත එහි පැමිණි මැර කණ්ඩායම විසින් කාර්යාලයට ගිණි තබා ඇත.
http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7626:vidyaratnas-office-at-his-residence-torched&catid=42:smartphones&Itemid=74



ඌව පළාත් සභා මැතිවරණය කාලයේදී විපක්ෂයේ මැතිවරණ කාර්යාල 50කට පමණ ප්‍රහාර එල්ල විය
[එජාප මැතිවරණ කාර්යාලයට අයත් පිළිස්සුණු ත්‍රී වීල් රථය Photo:CaFFE]

## 27. ඉලංගෙෙ තමිල් අරසු කච්චි (ITAK) තර්ජනය උදාසීන කිරීමට ආරක්ෂක ලේකම් වරයාට අවශ්‍ය වෙයි

වවුනියාවේදී පැවති ඉලංගෛ තමිල් අරසුකච්චි පක්ෂයේ 15 වන ජාතික සම්මේලනයේ දී සම්මත කර ගත් යෝජනා වලින් බොහොමයක් දේශාපාලන ව්‍යාකූලත්වයන් ඇති කිරීම අරමුණු කර ගෙන ඉදිරිපත් කළ ඒවා බව ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාපක්ෂ මහතා විසින් ප්‍රකාශ කර ඇති බව වාර්තා විය. එමනිසා ඉලංගෛ තමිල් අරසුකච්චි තර්ජනය උදාසීන කිරීමට නිශ්චිත ව්‍යාපාරයක් අවශ්‍ය බව ඔහු ප්‍රකාශ කර ඇත. ඉලංගෛ තමිල් අරසුකච්චි පක්ෂය උතුරු පළාත් සභාව පාලනය කරන දෙමල ජාතික සන්ධානයේ පක්ෂ 5 අතරින් ප්‍රධාන හවුල් කරුවෙකි. මෙසේ සම්මත වූ බොහොමයක් යෝජනා බෙදුම් වාදී අරමුණු සංතෘප්පත කරන ඒවා වන අතර ඒ මගින් ශ්‍රී ලංකා රජය අපහසුතාවයට පත් කරන බවද ඔහු ප්‍රකාශ කර ඇත. මේ තත්තවයට හේතු වූ යෝජනා පිළිබද ගැඹුරින් සලකා බලන මෙන් දෙමල ජාතික සන්ධානයට සහය දෙන ජාත්‍යන්තර ප්‍රජාවට මෙන්ම දේශීය දේශපාලන පක්ෂ වලටද රජපක්ෂ මහතා දැඩි ලෙස ඉල්ලා සිටියේය.

http://www.island.lk/index.php?page_cat=article-details&page=article-details&code_title=110143

## 28. අමාත්‍යවරයෙකු විපක්ෂ දේශපාලන පක්ෂ වලට සහය දෙන පුද්ගලයන්ගේ නාම ලැයිස්තුවක් ඉල්ලයි

වාර්මාර්ග සහ ජල සම්පත් කළමණාකරණ අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු වන පී. ඉලේපෙරුම මහතා විසින් ප්‍රධාන විපක්ෂ දේශපාලන පක්ෂ වන ජවිපෙ සහ එජාපයට සහය දුන් පුද්ගලයන් ගේ නම් ලැයිස්තුවක් ලබා දෙන ලෙස ඌව පළාතේ සියළුම රාජ්‍ය ආයතන වලට ලිපියක් යවා ඇති බව වාර්තා විය. මෙම ලිපිය මගින් රාජ්‍ය සේවකයන්ගේ මූලික අයිතීන් කඩ වීම පිළිබදව ඌව පළාත් සභා මැතිවරණයේ ජවිපෙ කණ්ඩායම් නායක සමන්ත විද්‍යාරත්න විසින් මානව මිහිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ගොනු කර ඇත.

http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7623:audio-siripala-wants-a-list-jvp-goes-to-hrc&catid=42:smartphones&Itemid=74